Discovery Series®

# ඇයි?

## අපගේ වේදනාවේ දී දෙවියන්වහන්සේ දැකීම



බිල් ක්‍රවුඩර්



හැඳින්වීම

# ඇයි යන ප්‍රශ්නය

## අපගේ වේදනාව තුළ දෙවියන්වහන්සේ දැකීම

කුඩා කාලයේ පටන් අපට අවශ්‍ය ආකාරයට දේවල් සිදුවනු දැකීමට අප කැමතිය. "මට කඩල එපා, මට ඕනෑ අයිස් ක්‍රීම්" "ඇයි මම මේ වෙලාවට නිදාගත යුත්තේ?" "මම ගෙය පිටුපසට වී සිටින්නම ඕනෑද?"

අප වයසින් වැඩෙන විට අපට වැඩි නිදහසක් ලැබෙන්නේ ය. අප බොහෝ දෙනෙකුට ඉක්මණින් අප කැමති සියලුම තීරණ ගැනීමට අවස්ථාව සැලසේ, නිදහස ඇතිව ජීවත් වන්නට අපව සැලසුම් කොට ඇත. මුළු මිනිස් වර්ගයාම එයට දැඩි ආශාවක් දක්වයි. එහෙත් අප පිළිබඳව මෙන්ම එකිනෙකා පිළිබඳවත් වගකීම ඇතිව අපව සැලසුම් කොට තිබේ.

කිසි මනුෂ්‍යයෙකු දූපතක් නොවේ, යයි ජෝන් ඩෝන් නමැති කවියා ලියා ඇත. ඔහු කථා කරන්නේ එක් මරණයක් සිදුවීම පවා අප එකිනෙකාට බලපාන්නේ කෙසේද යන්න ගැනය. එහෙත් ඔහුගේ නිරීක්ෂණය ජීවිතයේ සියල්ලටම අදාළ වන්නේය. සෑම මනුෂ්‍යය තීරණයක්ම ඉතිරි මිනිස් සංහතිය කෙරෙහි අඩුවැඩි වශයෙන් බලපෑමක් ඇති කරන්නේය. අපට එය මඟහැරීමට නුපුළුවන.

තෝරා ගැනීමේ නිදහස දෙවියන්වහන්සේ අපට දුන් සේක. ආදම් සහ ඒව එම නිදහස ක්‍රියාවට නැංවූ අවස්ථාවේ ඔවුන්ගේ අදූරදර්ශී තෝරා ගැනීම ලෝකයට දුෂ්ටකම හඳුන්වා දුන්නේය. අපට තවමත් ඒ නිදහස ඇත. එහෙත් අප ජීවත්වන්නේ එහි ප්‍රතිඵලයද සමඟය. එබැවින් අප සැබවින්ම නිදහස් යැයි අපට නොහැඟෙන්නේය.

දුක් විඳීම පවතින්නේ මන්ද? ඒ ගැන අපි දෙවියන්වහන්සේට වරද තබමුද? තෝරා ගැනීමට දෙවියන්වහන්සේ විසින් දී ඇති නිදහස අප දිනපතා දකින දුෂ්ටකම තුළ කුමන භූමිකාවක් ඉටුකරන්නේද? සැබවින්ම නිදහස්ව සිටීම යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?

අපගේ දිනපතා භෝජනය සේවාවන්

# පටුන


එක

**වේදනාව නමැති ගැටලුව . . . . . . . . . . . . . . . . . . *5***

දෙක

**අප දුක් විඳින්නේ මන්ද? . . . . . . . . . . . . . . . . . *10***

තුන

**තෝරා ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵල. . . . . . . . . *17***

හතර

**දෙවියන්වහන්සේ කොහිද? . . . . . . . . . . . . . . . *.27***

පහ

**දුක්විඳීමේ අවසානය . . . . . . . . . . . . . . . . . . . . . *.35***


---


***Why?*** *Seeing God in Our Pain*

පරිවර්තනයඃ ක්‍රිශාන්ති පෙරේරා

**MANAGING EDITOR:** J.R. Hudberg
**COVER IMAGE:** Getty Images/Ghislain & Marie David de Lossy
**COVER DESIGN:** Stan Myers
**INTERIOR DESIGN:** Steve Gier

Interior Images: (p.1) Getty Images/Ghislain & Marie David de Lossy; (p.5) Gerhard Lipold via Pixabay.com; (p.9) Constance Kowalik via Pixabay.com; (p.15) Imma via MorgueFile.com; (p.23) Emma Blowers via Pixabay.com; (p.29) Lisa Hansson via RGBStock.com.



© 2015, 2016 Our Daily Bread Ministries, Grand Rapids, MI. All rights reserved.
Printed in Sri Lanka



උපුටාගත් බයිබල් පාඨඃ©ශ්‍රී ලංකා බයිබල් සමාගම, 1995 සංශෝධිත පැරණි අනුවාදය



එක

# වේදනාව නමැති ගැටලුව

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයෙන් ඔබ්බෙහි වූ ඉන්දියන් සාගරයේ නිල් පැහැති කැළඹිලි රහිත ජලය වසර කිහිපයකට පෙර මහත් ව්‍යසනයක් සිදුවූ බවක් තහවුරු නොකරයි. “2004 වසරේ දී ඉන්දිය-න් සාගරයේ සිදුවූ භූ චලනයක් මඟින් හටගත් සුනාමියක් නිසා ප්‍රදේශයට මහා පරිමාණයේ විනාශයක් සිදුවිය. අහිමිව ගිය දේ අති විශාල විය. සාගරයේ ක්ෂණික පැන නැගීම මඟින් ඇති කළ බලපෑම තේරුම් ගැනීමට නොහැකි සීමාව ඉක්මවා ගියේය. රටවල් 14 ක ජීවිත 200,000 කට වඩා අධික ප්‍රමාණයක් අහිමි විය. එහෙත් ස්වභාව ධර්මයේ පහර වැඩි වශයෙන් දරන්නට සිදුවූයේ සුන්දර කුඩා දිවයිනක් වන ශ්‍රී ලංකාවටය. අවසානයේ ජලය ක්‍රමයෙන් බැස යන විට 35,000ක් මියගොස් 21,000 කට අධික පිරිසක් තුවාල ලබා සිටියහ. මිලියන භාගයක් පමණ සෙනඟකට තම නිවාස

අහිමි වී තිබූ අතර ඔවුන්ගේ ජීවිත මුළුමනින්ම අවුල් වී තිබුණි. ජාතියක් වශයෙනුත් ප්‍රජාවක පවුලක් මෙන්ම පෞද්ගලික මට්ටමිනුත් දැඩි බලපෑමක් සුනාමිය ශ්‍රී ලංකාවට ඇති කළේය.

ශ්‍රී ලංකාවේ සිදුවූ මහත් ව්‍යසනයෙන් පසු ලෝකයේ අඩක් ඈතින් පිහිටි මියෝරියේ පොප්ලින් හරහා 2011 මැයි මාසයේදී දැවැන්ත සුළි කුණාටුවක් හමා ගියේය. පැයකට සැතපුම් 250කට ආසන්න වේගයෙන් හමාගිය සුළි කුණාටුව නුවරට දැඩි විනාශයක් ඇති කරමින් මිනිස් ජීවිත 158ක් බිලි ගත් අතර 1,150 කට තුවාල සිදුකළේය. සිදුවූ දේපල හානිය ඩොලර් බිලියන 2.8 ක් විය.



වේදනාවේ සෙවණැලි මගේ ජීවිතය සිසාරා රිංගා පැමිණියද නැතිනම් මා ආදරය කරන්නාවූ අයගේ ජීවිතවල දැඩි වේදනාව බෙදාගත්තද, ජීවිතය අතරින් පතර නතරවන සේයාවක් පෙනෙන්නට තිබුණි.

මෙම සිද්ධීන් දෙක අතරතුර මිචිගන් හි ග්‍රෑන්ඩ් රැපිඩ්ස් ගුවන් තොටුපලෙහි පුද්ගලිකව දුක්විඳීමේ දර්ශනයක් සිදුවිය. ධාවන පථය එහා පැත්තේ ගුවන් යානයක් තුළින් මිනී පෙට්ටියක් ඉවතට ගනිමින් තිබුණි. ශෝකයට පත් පවුලක් මෙය සැබෑවක් බව සිතීමට උත්සාහ දරමින් සිටියෝය. අපි අපගේ ගුවන් යානයට ගොඩවූ අවස්ථාවේ ගුවන් නියමුවා ශබ්ද විකාශන යන්ත්‍රයෙන් මඟින් අමතා යානයේ දකුණු පැත්තේ සිටින සියලුදෙනා

ගෙන් ඔවුන්ගේ ජනේල් ආවරණ පහත් කර කවුළු වසා දමන ලෙස ඉල්ලා සිටියේය. "අපගේ සොල්දාදුවෙක් මේ මොහොතේ ගෙදර පැමිණ සිටියි. අපි ඔහුගේ පවුලේ අයගේ පෞද්ගලිකත්වයට බාධා නොකරමු" යයි ඔහු පැවසුවේය.

**වේදනාවේ සෙවණැලි** මගේ ජීවිතය හරහා රිංගා යන විට නැතිනම් මම ආදරය කරන්නාවූ අයගේ ජීවිතවල දැඩි වේදනාව දරුවකුගේ හෝ සහකරුවකු/සහකාරියකගේ බලාපොරොත්තු රහිත මරණයක් දරුවකු නාස්තිකාරයකු වීම, විවාහය, රැකියා, නිවාස, මිතුදම් අහිමිවීම බෙදා ගන්නා විට ඇතිවන වේදනාව, අහිමිවීම් හා ශෝකය මඟින් ජීවිතය අතරින් පතර නතරවන බවක් පෙනෙන්නට තිබේ.

`

සෑම ආකාරයකම සිද්ධීන් එකට එකතු කිරීමෙන් ජීවිතයේ මොසයිකය සෑදී ඇත. මොසයිකය යනු වෙවර්ණ කුඩා වීදුරු කැබලිති වලින් සකස් කළ චිත්‍රයකි.

දුරින් සිට බලන විට සම්පූර්ණ චිත්‍රය අලංකාරව පෙනේ, නමුත් සම්පූර්ණ මොසයිකයේ සුන්දර බව සෑම සිද්ධියකම පෙනෙන්නට නැත. ඇතැම් සිද්ධීන් සුන්දර බව හා වර්ණවත් බව බිඳක් එකතු කරන්නේය. අනෙක් වේලාවන්හිදී ප්‍රතිරූපය අඳුරු කරන්නේය. ඒවා අශෝභනය. කළු පැහැ ගන්නේය. ඒවා දුක්විඳින කාලයන්ය. බිය, වේදනාව, සිත් රිදුම් හා අහිමිවීම් නමැති වලාකුළු, ප්‍රීතියේ

සහ සැමරීමේ සතුටු අවස්ථා නිතරම අඳුරු කරන්නේය. අපගේ වේදනාව සිද්ධිය සිදුවන මොහොතට පමණක් සීමා නොවේ. අපගේ වේදනාවේ රළු දාර මඟින් බියේ හා සැකයේ ගැඹුරු සීරීම් අපගේ මනසේ ඇති කරන්නේය.

අපගේ අත්දැකීම් අපටම විශේෂිත වන නමුත් ඒවා මනුෂ්‍ය ජාතියට අසාමාන්‍ය දේ නොවේ. අප එක ගොන්නකට බැඳ තබන්නාවූ පොදු බැඳීම් වන්නේ වේදනාව හා දුක්විඳීම්ය. අප තනිව නැති බව දන්නා නමුත් එම දැනගැන්ම කිසිදු සහනයක් ගෙන නොදෙන්නේය. මෙතරම් දුක්විඳීම් හා වේදනා ඇතිවන්නේ මන්දැයි අපි විස්මයට පත්වන්නෙමු.


ස්වභාවිකව හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසනයන් වන මිනිස් ජාවාරම්, ඇබ්බැහිවීම්, රෝග, දුගී බව, කුසගින්න, සමූල මිනිස් ඝාතන, යුද්ධ, කුණාටු, (වචනාර්ථයෙන් හා රූපකමය ලෙස) නිසා බිඳී ගොස් ඇති ලෝකයක, බිය හා සැකය වැඩිවීමට උපකාර වන ව්‍යසනයන් තරමටම ඒවා ස්වභාවික බවත් පෙනී යයි.

යහපත් හා බලවත් වියයුතු යැයි අප අපේක්ෂා කරන දෙවි කෙනෙකු වෙත නැතහොත් බිඳීගිය ලෝකයක සිත් වේදනා හා අහිමිවීම් නතර කිරීමට ඇතැම් අවස්ථාවල අකමැති බවක් පෙන්වන හෝ ඇතැම්විට හැකියාවක් නොමැති බවක් පෙනෙන දෙවියන්වහන්සේ කෙනෙකු වෙත මෙම බිය හා සැකය බොහෝවිට අපි යොමුකරන්නෙමු.

දුක්විඳීම් ඇතිවන්නේ මන්ද? දුක්විඳීම් ඇතිවන විට දෙවියන්වහන්සේ සිටින්නේ කොතැනක ද? අප දුක්විඳින අවස්ථාවේ පවා දෙවියන්වහන්සේගේ යහපත්කම කෙරෙහි විශ්වාසය තැබිය හැකිද? මෙම ප්‍රශ්නවලට සම්පූර්ණ පිළිතුරු සොයාගැනීමට අපට හැකියාව නොමැති අතර යම් ආකාරයක ගැඹුරින් අධ්‍යයනය කිරීමක් පිලිප් යැන්සේ පවසන, අවසන් නොවන ගැටලුවට ප්‍රතිචාරයක් හෙළිදරව් කරන්නට ඉඩ ඇත.

අපගේ සොයාබැලීම් වලදී දෙවියන්වහන්සේ වෙතට හැරීම සඳහා අලුත් හේතු සොයාගැනීමට අපට පුළුවන. ශ්‍රී ලාංකිකයකු වන අජිත් ප්‍රනාන්දු පවසන පරිදි ඊට හේතුව උන්වහන්සේ අප සමඟ කෙඳිරිගාන්නා වූ දෙවියන්වහන්සේ, වන බැවිනි. අප මුහුණ පා සිටින තත්වය දරාගත නොහැකි බව පෙනී යන අවස්ථාවක පවා අප උදෙසා ඇති උන්වහන්සේගේ ප්‍රේමය කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව බයිබලය විස්තර කරන්නේය.

වේදනාව හා දුක්විඳීම වටහාගැනීමට අප කරන්නාවූ සොයාබැලීම් වලදී සුන්බුන් ඉවත්කරන විට, වැදගත් ප්‍රශ්න පිරික්සා බලන්නට අපට උපකාරවීමට බයිබලයේ ප්‍රඥාවට පුළුවන.



දෙක

# අප දුක්විඳින්නේ මන්ද?

මුළු රාත්‍රිය පුරා නිදිවර්ජිතව දැසේ කඳුළු අවසන් වන තුරුම ඔබ හැඬුවේ නම්, අවසානයේදී යම් ආකාරයක නිශ්චලතාවක් ඇතිවන බව ඔබ දන්නේය. කිසි දිනක යළි එවැන්නක් සිදු නොවන බවක් ඔබට හැඟී යනු ඇත.

(සී. එස්. ලුවිස්, *The Lion, the Witch and the Wardrobe*)

සදාකල් පවතින මේ ප්‍රශ්නයට (ඇයි?) පිළිතුරක් අපි කොපමණ ආශාවෙන් බලා සිටිමුදැ?යි පිලිප් යැන්සි ලියා ඇත. අප්‍රමාණ දුක්විඳීම් ගෙනදුන් සරාජෙවෝ හා වෙනත් යුද්ධ පිළිබඳව මිනිසුන්ගේ දුෂ්ටකමට වරද පැටවීමට පුළුවන. නිව්ටවුන්, බොස්ටන් හා ඒ හා සමාන ඛේදවාචකයන් පිළිබඳව මානසික රෝගී තත්වයකට හෝ විප්ලවකාරී මතවාදවලට හෝ අයහපත් වූ තුවක්කු නීතිවලට හෝ මව්පියන් වගකීම් නොසලකා හැරීමට වරද පැටවීමට

පුළුවන. සුනාමි හා වෙනත් ස්වභාවික ව්‍යසනයන් වලට වරද පැටවීමට වෙනත් කෙනෙකු නොමැති බැවින් ඒවා දෙවියන්වහන්සේගේ ක්‍රියා? ලෙස අපි වර්ගීකරණය කරන්නෙමු.

ඇයි යන ප්‍රශ්නයේ සෙවණැල්ල අප සියලුදෙනා මතට වැටී තිබේ. එය වැදගත් ප්‍රශ්නයකි. යේසුස්වහන්සේ පවා මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාදැ?යි (මතෙව් 27:46) මොර ගැසූ සේක. ඇඟිල්ල දිගුකර පෙන්විය හැකි හේතුවක් ඇයි යන ප්‍රශ්න සියල්ල සඳහා අයැදින්නේය. අපට අවශ්‍ය වන්නේ වරද පැටවීම සඳහා යම් පුද්ගලයෙකි.

කොපමණ උත්සාහ කළත් අපගේ වේදනාව වැලැක්වීමට දෙවියන්වහන්සේට හැකියාව නොමැති යයි පවසමින් ඇතැම් අය උන්වහන්සේට දොස් පවරති. නරකම තත්වය වන්නේ උන්වහන්සේ ඒ ගැන උනන්දුවක් නොදක්වන බවය" දුක්විඳීම් යක්ෂයා විසින් ඇතිකරන බව අනෙක් අය පවසති. අපගේ වේදනාව යක්ෂයාගේ දුෂ්ට ක්‍රියාවන්හි ප්‍රතිඵලය වන්නේය. ඒ අතර තවත් අය පවසන්නේ ඊට පිළිතුරක් නොමැති අතර කුමකට හෝ කවරෙකුට හෝ වරද පැටවිය නොහැකි බවය. සරලව ගතහොත් විශ්වය දැන් පවතින ආකාරයටම පවතිනු ඇති බැවින් පිළිතුරු අප සොයාගත යුතු එකම ස්ථානය වන්නේ අපගේ අභ්‍යන්තරයයි.



ඇයි යන ප්‍රශ්නය, එය ඇතිවීමට හේතුව,ඇඟිල්ල දිගුකිරීමට යමක් යදින්නේය. අපට අවශ්‍ය වරද පැටවීමට යම් පුද්ගලයෙකි.

කෙසේ වෙතත් බයිබලය අපට වෙනස් කථාවක් පවසන්නේය. උත්පත්ති පොතට අනුව දුක්විඳීම යනු ඉතාම ස්වාභාවික හා යහපත් වූ යම් දෙයක් හා බැඳී පැවතිය හැකි (පැහැදිලිවම සතුටින් භාර නොගන්නා) දෙයකි.

එබැවින් එය නොමැතිව සිටීමක් ගැන සිතාගත නොහැකිය. එනම් තෝරාගැනීමේ හැකියාවක් නොමැත.

**දෙවියන්වහන්සේගේ මුල්ම මැවීම.** උත්පත්ති 1 මැවීම පිළිබඳ සිදුවීම් විස්තර කරයි. දෙවියන්වහන්සේ තමන් මැවූ සියල්ල දෙස බලා සියල්ල, ඉතා යහපත්' යැයි වදාළ සේක (උත්පත්ති 1:31). අපගේ දුක්විඳීම මෙම සමීකරණයේ අත්‍යවශ්‍ය කොටසක් නොවූයේය. පළමු මිනිසා සහ ගැහැණිය, තේරුමක්, පරමාර්ථයක්, ප්‍රීතියක් පිරී තිබූ පැවැත්මක් භුක්ති වින්දෝය. ඒ සැමටම ඉහළින් ඔවුන්ට දෙවියන්වහන්සේ සමඟ බාධාවලින් තොර සම්බන්ධතාවයක් සහ මිනිසුන්ගෙන් තොර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් තිබුණේය. කෙසේ වෙතත් මෙය සිත් නොවදින තත්වයක් නොවීය. දෙවියන්වහන්සේ ආදම් සහ ඒව සඳහා නිවෙසක් ලෙස පරාදීසයක්ද ත්‍යාගකර ඔවුන්ගේ ජීවිතවලට තේරුමක්ද



දෙවියන්වහන්සේ
තමන් මැවූ සියල්ල
දෙස බලා
සියල්ල "ඉතා
යහපත්" බව
වදාළ සේක"
අපගේ දුක්විඳීම
සමීකරණයට අවශ්‍ය
කොටසක් නොවූයේය"

තමන්වහන්සේට ළංවීම සඳහා අවකාශයද දුන්නා පමණක් නොව තමන්ට ඒ දේවල් අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීමේ අවස්ථාවද දුන්සේක.

තෝරාගැනීම නම් ත්‍යාගය. උත්පත්ති 3 පරිච්ඡේදයෙහි සඳහන් සිද්ධීන් සරලව "වැටීම" ලෙස හැඳින්වේ. දෙවියන්වහන්සේ මිනිස් වර්ගයා, උන්වහන්සේගේ කැමැත්තේ රිද්මයට මුමුණන, වෙනත් රිද්මයක් තෝරා ගැනීමට හැකියාවක් නැති ඉබේ ක්‍රියාකරන පරිදි මැවූයේ නම් එහි ලියා ඇති දෙය කිසිසේත් සිදුනොවනු ඇත. ඒ වෙනුවට මැවුම්කරුවාණෝ ඔවුන්ට තමන් කැමති මාර්ගය තෝරා ගැනීමට ඉඩ දුන්සේක. ස්වාමී වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥාකරමින් නුඹට උයනේ සියලු ගස්වලින් කැමති ලෙස කන්ට පුළුවන: එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය, මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහි යයි කීසේක" (උත්පත්ති 2:16-17).

දෙවියන්වහන්සේ තමන් මැවූ සියල්ල දෙස බලා සියල්ල ඉතා යහපත් බව වදාළ සේක. අපගේ දුක්විඳීම සමීකරණයට අවශ්‍ය කොටසක්

වැටීම අදාළකර දක්වන්නේ ආදම් සහ ඒව දෙවියන්වහන්සේට අකීකරුවීම හා ඉන් අනතුරුව උන්වහන්සේ සමඟ තිබූ පරිපූර්ණ සම්බන්ධතාවයෙන් වැටීමය.

එය ව්‍යාකූල තෝරාගැනීමක් නොවූ නුමුත් සැබවින්ම සරළ වූයේද නැත. ව්‍යාකූල නොවන කොටස වූයේ කෑමට ගැනීම

හෝ නොගැනීම තෝරාගැනීමය. නුමුත් මේ තෝරා ගැනීමත් සමඟ ස්ත්‍රිය සහ පුරුෂයා තමන්ගේ කොන්දේසි මත ජීවිතය ගෙවන්නේද නැත්නම් තම මැවුම්කරුවාණන්ගේ කොන්දේසි මත ජීවත්වන්නේද යන්න තීරණය කරමින් සිටියෝය. ඔවුන් තමන්ගේම මාර්ගය තෝරා ගත්තෝය. තීරණය ගැනීමත් සමඟ (උත්පත්ති 3:6-7) තිරය වැසී ගියෙන් මුල් යුවළ නව යථාර්ථයකට ඇතුළු වූහ. එය තවදුරටත් දෙවියන්වහන්සේගේ යහපත්කම මගින් සුවිශේෂිතව හැඩ ගැසුණු යථාර්ථයක් නොවීය. දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ප්‍රතික්ෂේප කොට, තම මාර්ගයේ ගමන් කිරීමට ඔවුන් කළ තෝරා ගැනීම තුළ ගම්‍යවන දේ හා අත්වුණු ප්‍රතිඵල මගින් ඔවුන්ගේ හා ඔවුන් අනුව යන සියලු දෙනාගේ ජීවිත හැඩ ගස්වනු ඇත.

**තෝරාගැනීමෙන් අත්වූ ප්‍රතිඵල.** සී. එස්. ලූවිස් සිය හුදු ක්‍රිස්තුධර්මය (Mere Christianity) නමැති කෘතියේ, ආදම් සහ ඒවගේ තෝරාගැනීම නිසා ගම්‍ය වන දේ විස්තර කොට ඇත්තේ මෙසේය: “එම බලාපොරොත්තු කඩ වූ උත්සාහය වෙතින් අප මානව ඉතිහාසය යයි හඳුන්වනු ලබන සියල්ලම පාහේ මුදල්, දුගීබව, අනාගත අභිලාෂයන්, යුද්ධ, ගණිකා වෘත්තිය, පංති, විශාල ව්‍යාපාර, වහල් බව පැමිණ ඇත. එය අප සතුටු කිරීම සඳහා දෙවියන්වහන්සේ හැර වෙනත් දෙයක් සෙවීමට මනුෂ්‍යත්වය ගත් උත්සාහයේ දීර්ඝ දරුණු කතන්දරය වන්නේය.”

එම තෝරාගැනීමෙන් ඇතිවූ පසු කම්පනවලින් සෑම පරම්පරාවක්ම දෙදරා යන්නේය“ ආදම් සහ ඒවගේ තෝරාගැනීමෙන් අත්වූ ප්‍රතිඵලවල බර කරට ගැනීමට

අමතරව අපගේම තෝරාගැනීම් මගින් ඇතිවූ බර උසුලායාමට සිදුව ඇති නිසා කුඩු ගැසීද සිටින්නෙමු.

තෝරාගැනීම කරණ කොටගෙන විනාශදායක බලපෑම් ඇතිවිය හැකිව තිබියදීත් දෙවියන්වහන්සේ සහ අප අතර සම්බන්ධතාව බිඳීයාම ඉතාම පැහැදිලිව පෙනී යන අවස්ථාවලදී දෙවියන්වහන්සේ අපට කැමති දේ තෝරා ගැනීමට ඉඩහරින සේක. අපගේ තෝරාගැනීම් වලට අසාමාන්‍ය බලපෑමක් තිබේ. තෝරා ගැනීමේ ත්‍යාගය සමඟ තෝරා ගැනීම් මගින් බලපෑම් සිදුවන්නේය යන යථාර්ථය පැමිණියේය. තෝරා ගැනීමට අපට ඇති හැකියාව වැළඳ ගන්නටත්, තෝරාගැනීම නිසා ප්‍රතිඵල ඇතිවන බව ප්‍රතික්ෂේප කිරීමටත් හැකියාවක් නොමැත. අපි තෝරා ගැනීමක් කළ විට යමක් සිදුවන්නේය. එහි විලෝමය ලෙස වෙනත් දෙයක් සිදුනොවනු ඇත. තෝරාගැනීම් වලට ප්‍රතිවිපාක ඇත.



තෝරාගැනීමේදී විනාශකාරී වියහැකි බලපෑම් තිබියදී දෙවියන්වහන්සේ සහ අප අතර පවතින සම්බන්ධතාව බිඳී යන බව පැහැදිලිව පෙනෙන අවස්ථාවේ වුවද දෙවියන්වහන්සේ අපට තෝරාගැනීමට ඉඩහරින සේක.

ආදම් සහ ඒවගේ කථාන්තරය සම්බන්ධයෙන් පිලිප් යැන්සේ ඔහුගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට මෙසේ පවසයි. “ඔබට දෙවියන්වහන්සේත් මේ ලෝකය ගලායන ආකාරයත් ප්‍රතික්ෂේප කිරීමේ නිදහස ඇත.


දෙවියන්වහන්සේ තමන් ප්‍රතික්ෂේප කිරීමට අපට නිදහස දී තිබෙනවා පමණක් නොව, ප්‍රතික්ෂේප කිරීමේ වචන අපගේ ශුද්ධ ලියවිල්ලෙම ඇතුළත් කොට ද ඇති නිසා දෙවියන්වහන්සේට මම ගෞරව කරන්නෙමි.

මෙම ප්‍රතික්ෂේප කිරීම ඇයි යන ප්‍රශ්නයට එක පිළිතුරක් සපයන නුමුත් තව ප්‍රශ්නයක් මතු කරන්නේය: අපගේ ලෝකය තුළ දුක්විඳීම, සිත් බිඳීයාම හා අරගල පවතින්නේ මන්ද? ඒ දෙවියන්වහන්සේ තෝරා ගැනීමට මනුෂ්‍ය වර්ගයාට ඉඩදුන් නිසාය" අප වටා ඇති ලෝකය තෝරාගැනීමේ බර හා ඉන් අනතුරුව කළ තෝරා ගැනීම්වල බර දරා යන්නේය.

**එහෙත්...**

එය ගැටලුවක් වන්නේ මන්ද? ආදම් සහ ඒවගේ තීරණ මෙන් අපගේ තීරණ ද හිස් අවකාශයක සිදු නොවන්නේය. ඒවාට ප්‍රතිවිපාක ඇත.

එම ප්‍රතිවිපාක කෙබඳුද?



තුන

# තෝරාගැනීමේ ප්‍රතිවිපාක

අපට දුක්විඳීම සිදුවන බවට පොරොන්දු ලැබී ඇත. ඒවා වැඩ සටහනෙහි කොටසක් වන්නේය (ආදම් සහ ඒවගෙන් පසු ශෝකවන්නෝ ආශීර්වාද ලද්දෝය) යනුවෙන්ද අපට පවසා ඇති බැවින් මම එය පිළිගනිමි. මම කේවල් නොකළ කිසිවක් මා හට ලැබී නොමැත. ඇත්ත වශයෙන්ම වෙනත් කෙනෙකුට සිදුනොවී දෙයක් තමන්ටම පරීකල්පනයක් ලෙස නොව ඇත්තටම සිදුවීම තුළ වෙනසක් ඇත.

(සී. එස්. ලූවිස්. , *A Grief Observed*)

සෑම ක්‍රියාවකටම ප්‍රතික්‍රියාවක් තිබේ. සෑම තෝරාගැනීමකටම ප්‍රතිඵල ද ඇත. ආදම් සහ ඒව ගත් තීරණයට පෞද්ගලිකව හා අන්තර් පුද්ගල වශයෙනුත් ක්ෂණිකව හා ආනුෂංගිකවත් වූ පරාසයක ප්‍රතිවිපාක තිබුණේය.

ආදම් සහ ඒවගේ තෝරාගැනීමේ ක්ෂණික පසු බලපෑම් අපගේ ලෝකයේ පැහැදිලිවම පෙනෙන යථාර්ථය, එනම් තෝරාගැනීමේ ප්‍රතිවිපාක ලෙස දුක්විඳින්නා වූ ලෝකය

විස්තර කරන්නේය. උත්පත්ති පොතෙහි කථාන්තරය ඒදන් උයනෙන් ඔබ්බට යනවිට විවිධ ප්‍රතිවිපාක දිගහැරෙන්නේය. පහත දැක්වෙන දෑ එයට ඇතුළත්ය.

**ක්ෂණික ප්‍රතිවිපාක.** ආදම් සහ ඒව ලෝකයට පාපය මුලින්ම හඳුන්වා දුන් දෙදෙනා බවට පත්වූවා පමණක් නොව එහි ප්‍රතිවිපාක මුලින්ම දැණුනු දෙදෙනාද වූයේ ද ඔවුන්ය. එම ප්‍රතිවිපාක ජීවිතයේ බොහෝ වැදගත් අංශවලට බලපෑවේය.

පළමුව, දුක්විඳීම මැවිල්ල තුළට හඳුන්වා දෙනු ලැබීය. වැඩ කිරීම දැන් වෙහෙසකර වන්නේය (උත්පත්ති 3:17-19). මුලින් තෘප්තියක් පමණක් ගෙන දුන්නාසේ පෙනෙන වැඩකිරීම දැන් බලාපොරොත්තු කඩවීම හා කර්කශ වූ වෙහෙසවීම මගින් වසාගෙන ඇත. ආදම්ට තමාගේ කාර්ය සඳහා බහුල ඵල සතුටින් භුක්තිවිඳිනු වෙනුවට දැන් ශාපයේ බලපෑමට යටත්ව ඇති මැවිල්ලේ මූලධාතු සමඟ සටන් කිරීමට සිදුවිය. ආදම්ගෙන් පසු පරම්පරාවල වැඩකිරීමේ වෙහෙස අඩුවී නොමැත, අප අපේක්ෂා කරන දෙය අපගේ ශ්‍රමය අත්පත්

බොහෝ ඉංග්‍රිසි සංස්කරණයන්හි උත්පත්ති 3:17හි සඳහන් වෙහෙස යන වචනය හෙබ්‍රෙව් බසින් itsabon ය. මෙම වචනයේ මූලය වන්'ඉ යන්න ශෝකය අඟවන අතර දුෂ්කර හෝ බලාපොරොත්තු සුන්වන ආකාරය ප්‍රතිඵල ගෙනදෙන අතිශය වෙහෙසකර ක්‍රියාවක් ඉඟි කරන්නේය.

කරගනු දැකීම සඳහා අප තවමත් සටන් කරන්නෙමු.

දෙවනුව, පුරුෂයා හා ස්ත්‍රිය අතර සම්බන්ධතාවට එය බලපෑවේය. ඔවුන්ගේ අහිසංක බව (උත්පත්ති 2:25) වෙනුවට ලජ්ජාව හා තමන් පිළිබඳව අනවශ්‍ය ලෙස සිතීම ආදේශ විය (උත්පත්ති 3:10). පාපයට වැටුණු ලෝකයක ජීවිතය පිළිබඳව නව යථාර්ථය වන්නේ ඔවුන්ගේ අන්‍යෝන්‍ය යහපත පිණිස වූ කාර්යයන් සහ සහයෝගය, ආධිපත්‍යය හා ආතතිය බවට පත්වීමයි“ දෙවියන්වහන්සේගේ ස්වරූපය දරන අයගෙන් වඩ වඩා ලෝකය පිරවීම සඳහා දරුවන් වැදීම ඒවට ප්‍රිතියක් වියයුතුව තිබු නුමුත් දැන් දරු ප්‍රසුතියේදී ඇය වේදනා හා වෙහෙස විඳින්නීය (උත්පත්ති 3:16).



පාපයට වැටුණු ලෝකයක ජීවිතය පිළිබඳ යථාර්ථය වන්නේ පොදු වාසිදායක වැඩ සහ සහයෝගය ආධිපත්‍යය හා ආතතිය බවට පත්වීමයි.

කෙසේ වෙතත් අවසානයේදී තෝරාගැනීම නිසා වඩාත්ම හානියට පත්වූ සබඳතාව වූයේ මනුෂ්‍ය වර්ගයා දෙවියන්වහන්සේ අතර තිබූ සම්බන්ධතාවය ය. මනුෂ්‍ය වර්ගයා සතුව තිබූ බාධාවකින් තොරවූ ඉතා සමීපත්වය දැන් කැඩී නැතිවී ගොසින්ය. අකීකරුවීමට තෝරාගැනීම මගින් මැවුම්කරුවාණන් සහ උන්වහන්සේගේ ස්වරූපයෙන් මවන ලද මනුෂ්‍යයා අතර පරතරයක් ඇති කළේය. මැවුම්කරුවාණන් මනුෂ්‍යයා තුළට හෙළූ ජීවනයේ හුස්ම

ක්‍රම ක්‍රමයෙන් අවසන් වන්නේය. ඇතැම්විට එය සිදුවන්නේ ක්ෂණිකව නොවන්නට පුළුවන. එහෙත් එය වැළැක්විය නොහැකිය (උත්පත්ති 3:19). එසේ වන්නේ ආදම් හා ඒව තුළ පමණක් නොව, එතැන් පටන් සෑම මනුෂ්‍යයකු හටම එය සිදුවන්නේය.

එම පළමු තෝරාගැනීම තුළින් වූ ක්ෂණික සහ ජීවිතය වෙනස් කරන්නාවූ ප්‍රතිවිපාක ආදම් සහ ඒවගේ ජීවිතවල පෞද්ගලික හා අප්‍රකට පැතිකඩ තුළ පිළිබිඹු වූයේය.


කෙසේ වෙතත් මිනිසා සහ ගැහැනිය විසින් ක්ෂණිකව විඳි එම ප්‍රතිවිපාක ඔවුන්ගෙන් ඔබ්බට ගොස් ඔවුන්ට පසුව පැමිණෙන මිනිස් වර්ගයාගේ සියල්ලන් වෙතද විහිද ගියේය.

**අන් අයගේ තෝරාගැනීම් නිසා දුක්විඳීම.** ආදම් සහ ඒවගේ තෝරාගැනීම්වල විපාක එක් අතකට අපි සියලුදෙනාම විඳින්නෙමු" කෙසේ වෙතත් අප මුල් දරුවන් වෙතට

> ආබෙල් කෙරෙහි වූ කායින්ගේ ඊර්ෂ්‍යාව උච්චස්ථානයට පැමිණි අවස්ථාවේ, තෝරාගැනීමට කායින් හට තිබූ හැකියාව දෙවියන්වහන්සේ ඔහුට සිහිපත් කළ සේක. "පාපයේ දොරකඩ ළඟ සිටියි. එහි ආශාව නුඹ කෙරෙහි වන්නේය. නමුත් නුඹ එය ආණ්ඩු කළයුතුය." (උත්පත්ති 4:7)

ඉදිරියට ගමන් කරන විට අපි සියලු දෙනාම පැහැදිලිවම වෙනස් ආකාරයක තෝරාගැනීම් කරන බවද දකන්නෙමු. එම තෝරාගැනීම් කටුක ලෙස අපට රිදවන ආකාරයටම අන් අයටද බොහෝ විට රිදවන්නේය. කායින් සහ

ආබෙල්ගේ කතන්දරයේ (උත්පත්ති 4:1-12) මුල් සහෝදරයින්ගේ ගැටුම හා එදිරිවාදිකම අවසාන වූයේ මිනී මැරුමකින් බව අපි දකිමු.



බොහෝ අවස්ථාවන්හි අන් අයගේ අපරාධ අහිංසක අයගේ ජීවිත මත පතිත වන්නේය.

ප්‍රථම මනුෂ්‍ය ඝාතනයම ඛේදවාචකයක් විය. නුමුත් අප තෝරාගැනීම් කරන කල, විශේෂයෙන් ආත්මාර්ථකාමී හැඟීමෙන් අපගේ තෝරාගැනීම් කිරීම හේතුකොටගෙන අන් අය කෙරෙහි කෙබඳු ආකාරයේ දුක්විඳීම් ඇතිකර ගන්නේ ද යන්න එය නිදර්ශනය කොට දක්වන්නේය. බොහෝ අවස්ථාවන්හි අන් අය කරන වැරදි අහිංසක අයගේ ජීවිත කෙරෙහි අපරාධ බවට පත් වන්නේය. මිනිස් සංහාර හා සමූලඝාතන සිදුවන අවස්ථාවන්හි දී අප්‍රමාණ ජීවිත සංඛ්‍යාවක් තමකම සහ ආත්මාර්ථකාමය දෙමින් දෙවිවරුන්ට පූජාවන් ලෙස ඔප්පු කොට ඇත. බලය, ධනය හෝ ඒ දෙකම හඹා යාමේදී, පරාජිත බව තුළ විකෘති වූ හදවත්වල තෝරා ගැනීම්වල ඉහළම මිල වන්නේ මිනිස් ජීවිලවල වටිනාකම හා දුක් විඳීම් ය.

කැඩී බිඳී ගිය ලෝකයක ජීවත්වීම නිසා දුක්විඳීම. දෙවියන්වහන්සේ සෑදුවාවූ ලෝකය පුරා මිනිස් වර්ගයා පැතිරී යනවිට පාවාදීම්, ප්‍රචණ්ඩත්වය, අපයෝජනය, යුද්ධය හා තවත් බොහෝ දේ ඒ සමඟ පැතිර ගොස් ඇත. ඒදන්

උයනෙන් හා දෙවියන්වහන්සේ වෙතින් මනුෂ්‍ය වර්ගයා කොපමණ ඈතට ගොස් ඇතිදැයි ඔවුන්ගේ තෝරාගැනීම් එළිදරව් කරන්නේය. මෙය උත්පත්ති 6:5-7හි වේදනාකාරී අයුරින් පැහැදිලි වන්නේය. වැටුණා වූ ජාතියක පරාජිත බව දෙවියන්වහන්සේගේ හදවත කෙතරම් දැඩි ලෙස ශෝකාකුල කළේ ද යත් පොළොව විනාශ කරන පිණිස උන්වහන්සේ ජලගැල්මක් එවූ සේක. එතැනින් උන්වහන්සේ සියල්ල ආරම්භ කරනු ඇත.

කෙසේ වෙතත්, මැවිල්ල කෙරෙහි මිනිසාගේ තෝරා ගැනීම් කළ බලපෑම ද ජලගැල්මේ විනාශකාරී සිද්ධිය වෙතින් පිළිබිඹු වන්නේය" ක්‍රමයෙන් වැඩිවන පාපයේ බලපෑම ජලගැල්ම එළිදරව් කළේය. එසේම මනුෂ්‍ය වර්ගයා කරන්නාවූ තෝරාගැනීම්වල ප්‍රතිවිපාක මැවිල්ලට ද උසුලන්නට සිදුවන බව ඉන් පෙන්නුම් කරයි. රෝමවරුන් හට ලියූ ලිපියේ පාවුල් අපෝස්තුළුවරයා මේ බව තහවුරු කළේය. "මක්නිසාද මුළු මැවිල්ල මේ දක්වා එක්ව කෙඳිරිගාමින් ගාවිනා විඳින බව අපි දනිමුව" (රෝම 8:22).

මැවිල්ලේ කෙඳිරිගෑම ආරම්භ වූයේ, ආදම් බෝග වගාකිරීමට උත්සාහ කළ අවස්ථාවේ කටු සහ ගොකටු වැවෙන්නට පටන්ගත් විටය" අධිස්වභාවික ජලගැල්මක් නිසා ස්වභාවිකව ඇතිවන පීඩනය භූමිය දරා සිටියේය. එය තවමත් කෙඳිරිගාන්නේය. එය ප්‍රකෘති තත්වයට පත්ව ක්‍රියාකළ යුතු ආකාරයට යළි ක්‍රියාත්මක වනතුරු නොකඩව කෙඳිරිගාන්නේය.

(යෙසායා 65:17, 66:22, 2 පේත්‍රුස් 3:13, එළිදරව් 21:1, රෝම 8:18-30 ද බලන්න). අජිත් ප්‍රනාන්දු පවසන පරිදි "වැටීම සමඟ විශ්වයට එහි සමතුලිතභාවය අහිමි විය." මැවිල්ල කෙඳිරිගාන විට එය හා එක්ව අපි ද කෙඳිරි ගාන්නෙමු.

දුක්විඳීම් සුළු කාලයකට කල් දමන ලදී. සෑම ප්‍රතිවිපාකයක්ම ක්ෂණිකව අත්විඳින්නට සිදු නොවේ. ඇතැම් අවස්ථාවල අපට හා අප අවට සිටින අයට අපගේ තෝරා ගැනීම් බලපාන ආකාරය දැකගන්නට නොහැකිය. යෝසෙප්ගේ සහෝදරයින් වහල්භාවයට ඔහු විකුණූ අවස්ථාවේ (උත්පත්ති 37) දුක්විඳීම් වලට භාජන වූයේ ඔහු පමණක් නොවේ. යාකොබ්ට වටිනා පුත්‍රයෙකු අහිමිවිය. එසේම තමාගේ අතීත පාප, තමාගේම පුත්‍රයින් විසින් යළි කරනු දැකීමෙන් ඔහු මානසික පීඩාවට පත්වූයේය.

යෝසෙප්ගේ සහෝදරයින් ඔවුන්ගේ තෝරාගැනීමේ ප්‍රතිවිපාකවලින් බේරී ඇති බව පෙනී ගියද ඇත්ත වශයෙන් සිදුවූයේ ඒවා පසුවට කල් යාමය. යෝසෙප් මිසරයේ ජීවත්වූ කාලය අතරවාරයේ-යහපත් කාලය උදාවීමට පෙර අයහපත්

> යෝසෙප්ගේ වහල්භාවට අයහපත් තත්වයන් නොවන්නා සේ මිසරයේ ජීවත්වූ කාලයේදී ලිංගික බලහත්කාරයක් කිරීමට තැත්කළ බවට බොරු චෝදනාවක් ද නගනු ලැබ වසර ගණනාවක් සිරගෙයි සිටියේය. මෙහිදී ඔහු උපකාර කළ කෙනෙකු විසින් ඔහු අමතක කරනු ලැබීය.

බවට පත් අවුරුදුවල යෝසෙප්ට හා තම පියාට විරුද්ධව

කළ ආත්මාර්ථකාමී ක්‍රියා හේතුකොටගෙන වරදකාරීත්වයේ හැඟීම්වල බර කර දරන්නට සහෝදරයන්ට සිදුවිය.

වරදකාරී බව යනු තෝරාගැනීම නිසා ඇතිවන මානසික ප්‍රතිවිපාකයක් අපට හෝ අන් අයට දුක්විඳීමට හේතුවන නරක හෝ දුර්වල තෝරාගැනීම් අප කරන කල අපි මේ ආකාරයේ ප්‍රතිවිපාක අත්විඳින්නෙමු.

බයිබලයේ කතන්දරයේ අඛණ්ඩව පවත්නා එක මූලික කාරණයක් වන්නේ තෝරාගැනීම් කරණකොටගෙන ඇති වන ප්‍රතිවිපාක නොවැලැක්විය හැකි වුවද ඒවා සැමවිටම ක්ෂණිකව සිදුනොවන බවය.

ආත්මාර්ථකාමී විනාශකාරී සෙනඟ සමෘද්ධිමත් වීම ගැන ආසාප් ගීතාවලිය 73හි වැලපෙන්නේය.

දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ සෙනඟ කෙරෙහි වූ ඔවුන්ගේ ක්‍රියා, වචන හා ආකල්ප පිළිබඳව ඔවුන්ට කිසි දිනෙක ගණන්දීමට සිදුවන්නේ දැයි ඔහු විමතිය පල කරන්නේය. ඔහු අලුත් වටහාගැනීමක් ලබන්නේ දෙවියන්වහන්සේගේ අභිමුඛයට පැමිණීමෙන් පසුව පමණකි. දෙවියන්වහන්සේගේ කාලවකවානු අපගේ කාලවකවානු සමඟ නොගැලපෙන බව ඔහු දකින්නට පටන්ගන්නේය" ආසාප්ගේ ව්‍යාකූල බව ඔහුගේ සිතිවිලි පාලනය කළේය. "මා විසින් දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානයට ගොස් ඔවුන්ගේ අන්තිමය ගැන කල්පනා කරන තෙක්, එය මට අධික

වේදනා සහිත විය. එය දැනගත හැකි කෙසේදැයි සිතමින් සිටියෙමි. සැබවින් ඔබ ඔවුන් ලිස්සන තැන්වල සිටුවන සේක. ඔබ ඔවුන් විනාශයට හෙළනසේක. (ගීතාවලිය 73:16-18).



ආසාප්
අලුත් වටහා
ගැනීමක්
ලබාගන්නේ

වැරදි කරන්නවුන්ට තමන් පරාජය කළ නොහැකි බවක් හැඟී ගියද ආසාප් අවසානය දකින්නට පටන්ගන්නේය. අස්වැන්න නෙළා ගැනීම නොමැතිව, දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සියලුම ගනුදෙනු ඔක්තෝම්බර් මාසයේ බේරුම් නොකරන සේක යැයි පැරණි ගොවීන්ගේ ප්‍රස්ථාව පිරුළක් තිබේ. ලෝකය තුළ දුක්විඳීම ඇතිකරන්නාවූ ඕනෑම තෝරාගැනීමක් සඳහා ප්‍රතිවිපාක ලැබීම අනවශ්‍ය ලෙස පමාවන බව පෙනෙන්නට තිබුණද මුළු පොළෙවේම විනිශ්චයකරුවාණන් හරි දෙය කරන සේක. දෙවියන්වහන්සේගේ කාලවකවානු පැමිණි විට යුක්තිය ප්‍රබල ජලධාරාවක් සේ ගලායන දිනයක් පැමිණෙනු ඇත. ඒ අද දවස නොවන්නට පුළුවන.

මෙම පමාව වනාහි දෙවියන්වහන්සේගේ දිව්‍යමය වරප්‍රසාදයයි. නුමුත් එය උන්වහන්සේගේ අනුග්‍රහය පෙන්නුම් කිරීමක් වීමට ඉඩ තිබේ. දෙවියන්වහන්සේගේ ඉවසීමෙන් අපේක්ෂා කළේ සෙනඟට

පසුතැවිලි වී ආපසු උන්වහන්සේ වෙතට හැරීමට ඉඩහැරීම පේත්‍රුස් අපට සිහිපත් කරන්නේය (2 පේත්‍රුස් 3:9). නුමුත් මෙම ප්‍රමාදවීම ඉච්ඡාභංගත්වය ද සැකය ද ගෙන එන්නේය. "උන්වහන්සේ කොහෙත්ම මේ ගැන නොසලකනවා ද?"යි අප විමතියට පත්වනවා පමණක් නොව උන්වහන්සේගේ ජීවමානව සිටින්නේද යන්න ගැන පවා ප්‍රශ්න කරන්නෙමු.



හතර

# දෙවියන්වහන්සේ කොතැනද?

**දෙවියන්වහන්සේ සමඟ මා තර්ක කළේ විශ්වය ඉතා කුරිරු හා අසාධාරණ තැනක් සේ පෙනීයාම පිළිබඳවය“ නුමුත් මෙම සාධාරණ හා අසාධාරණ යන සිතුවිල්ල මට ලැබුණේ කෙලෙසින්ද? සෘජු රේඛාවක් පිළිබඳ අදහසක් නොමැති මනුෂ්‍යයෙකු යම් රේඛාවක් ඇද බව නොපවසන්නේය. මේ විශ්වය අසාධාරණ යයි මා පවසන්නේ එය කුමක් සමඟ සසඳමින්ද?**

**(සී. එස්. ලූවිස්. හුදු කිතුදහම)**

වේදනාව අප සියලු දෙනා දේවධර්මාචාර්යවරුන් කරන්නේය. “වේදනාව යනු අනවශ්‍ය කිසිවක් නොමැතිව ශුද්ධවූ තැනන්වහන්සේ මුහුණට මුණගැසීමට ඇති වේගවත් මාර්ගවලින් එකකි”යි බාබාරා බ්‍රවුන් ටේලර් ලියා ඇත. දෙවියන්වහන්සේගේ ස්වභාවය හා චරිතය පිළිබඳව වෙනත් කිසිවෙකුටත්, වෙනත් කිසි කාලයකටත්

වඩා දුක්විඳින්නන් ඇසිය යුතු ප්‍රශ්න වැඩිපුර අසන්නේය.



අපගේ මැවුම්කරුවාණන් අපගේ වේදනා පිළිබඳව උදාසීනවනු වෙනුවට අපගේ දුක් විඳීම් මධ්‍යයේ අප ගැන සලකන සේක.

එසේනම්, මේ සියල්ල තුළ දෙවියන්වහන්සේ කොතැනකද? දෙවියන්වහන්සේ පිළිබඳව තේරුම් ගැනීමට කරන ඕනෑම උත්සාහයක දුක්විඳීමේ දේවධර්මය, එනම් දුක්විඳීම්වලින් බැහැරව නොව ඒ මධ්‍යයේ දෙවියන්වහන්සේ තේරුම්ගැනීම ඇතුළත් වියයුතුය.

ආදම් සහ ඒවගේ තෝරා ගැනීම අපට දයාද කොට ඇත්තේ දුක්විඳීම සම්මතයක් වූ ලෝකයක් මිස දුක්විඳීම බැහැර කළ හැකි ලෝකයක් නොවේ. අපගේ මැවුම්කරුවාණන් අපගේ වේදනා පිළිබඳව හැඟීම්වලින් තොරව සිටිනු වෙනුවට අපගේ දුක්විඳීම් මධ්‍යයේ උන්වහන්සේ අප ගැන සැලකිලිමත් වන සේක. තමන්වහන්සේම දුක් විඳීම පවා උන්වහන්සේ තෝරාගත් සේක. දුක්විඳීම කුමක්දැයි උන්වහන්සේ දන්නා බැවින් අපගේ දුක්විඳීම් මධ්‍යයේ අපට උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට පුළුවන.

දෙවියන්වහන්සේම දුක්විඳීම පිළිබඳ උන්වහන්සේගේ පොරොන්දුව, තේරුම්ගැනීමට අසීරු

මට්ටමකින් දුක්විඳීම පිළිබඳ බයිබලයේ පිටු අතර සඳහන් වන කතන්දර මිනිසාගේ දුක්විඳීම පිළිබඳ අපගේ පුවත්වත් සිරස්තල සමඟ තරඟ වදින්නේය. එසේ වුවත් මෙම වේදනාකාරී හද කකියවන සිහි බුද්ධියෙන් යුත් කතන්දර මධ්‍යයේ දෙවියන්වහන්සේ දුක්විඳීමට ප්‍රතිචාර දක්වන බවට පොරොන්දුවක් අපට ඇත" එම දුක් විඳීම යහපත් හා සුන්දර දෙයක් බවට හැරවීමට යන වියදම අප කිසිවකුටත් කිසිකලෙක ගෙවා නිමකිරීමට නොහැකිය. දෙවියන්වහන්සේ වෙතින් ඉවත හැරීම අප තෝරාගත් නිසා අපි අපම නුසුදුස්සන් කරගෙන සිටින්නෙමු.

ගළවාගන්නාවූ, නිදහස්කරගන්නාවූ තැනැත්තෙකුගේ පැමිණීම පිළිබඳව යෙසායා අනාගතවක්තෘ කථා කළේය. උන්වහන්සේ පැමිණි විට බිඳුනා වූ ලෝකයේ දුක් විඳීම්වලින් අවසානයේදී අපව ගලවාගනු ඇත" අප සමඟ දුක්විඳීම මගින් බලාපොරොත්තු නොවූ ආකාරයකින් උන්වහන්සේ එම ගළවාගැනීම අපට දානය කරන සේක" දුක්විඳීමෙන් අප ගළවාගන්නාවූ තැනන්වහන්සේ පිළිබඳව හා උන්වහන්සේ විඳි දුක් ගැහට පිළිබඳ කතන්දරය යෙසායා 53 අපට පවසන්නේය.

උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් සුළුකොට, එපා කරනු ලැබූසේක. වේදනා ඇත්තාවූ දුක දන්නාවූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන් විසින් තමුන්ගේ මුහුණ සඟවාගන්න කෙනෙකු මෙන්, උන්වහන්සේ සුළු කරනු ලැබූසේක. අපිද උන්වහන්සේ නොසැලකුවෙමුව. සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ

අපේ දුක්ය" දරාගත්තේ අපේ ශෝකය" එසේ වී නුමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද ලැබූ කෙනෙකැයි අපි සිතීමුව. නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය: උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව. ස්වාමින්වහන්සේද අප සියල්ලන්ගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූසේක. උන්වහන්සේට පීඩාකළ විට උන්වහන්සේ යටත්වී තමන්ගේ මුඛය නෑර සිටි සේක. මරන්ට ගෙනයන බැටළු පැටවකු මෙන්ද බැටළු දෙනක් ලෝම කපන්නන් ඉදිරියෙහි නිශ්ශබ්දව සිටින්නාක් මෙන්ද උන්වහන්සේ තමන් මුඛය නෑර සිටිසේක (යෙසායා 53:3-7).

දුක්විඳීම විස්තර කිරීමට යෙසායා උපයෝගී කරගත් වචන කෙතරම් තියුණු දැයි බලන්න: සුළු කිරීම, එපා කරනු ලැබීම, දුක්විඳීම, වේදනා විඳීම, දඬුවම් විඳීම, පහර කෑම, පීඩා විඳීම, සිදුරු කරනු ලැබීම, පොඩිකරනු ලැබීම, තුවාල කිරීම, මරන්ට ගෙනයාම.

මේවා ඉතා රළු වචන වන්නේය. ඒවා දුක්විඳින සෑම පුද්ගලයෙකුම තේරුම්ගන්නාවූ වචන වේ. නුමුත් මේවා යේසුස්වහන්සේ කුරුසිය මත උසුලා සිටියාවූ දුක්විඳීම නිශ්චිතවම විග්‍රහ කරන්නාවූ වචන වන්නේය. උන්වහන්සේගේ ජීවිතය තුළින් හා විශේෂයෙන්ම උන්වහන්සේගේ මරණය

තුළින් යේසුස්වහන්සේ අපගේ දුක්විඳීම තේරුම්ගන්නා අතර අප සමඟ අනන්‍යවන සේක. ජෝන් ස්ටොට් දේවධර්මාචාර්යවරයා මෙසේ ලියා ඇත. "කුරුසිය නොවන්නට මම කිසිදිනෙක දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන්නට ඉඩ තිබුණි. මම විශ්වාසකරන එකම දෙවියන්වහන්සේ වන්නේ නිට්ශේ නමැති දාර්ශනිකයා විසින් "කුරුසිය මත සිටින දෙවියන්වහන්සේ" යනුවෙන් පරිහාසයට ලක්කළ තැනන්වහන්සේය. සැබෑ වේදනාව පිරි ලෝකයක වේදනාවෙන් නිදහස් දෙවියන්වහන්සේ කෙනෙකුට නමස්කාර කරන්නේ කෙසේද?"

දුක්විඳීමෙන් නිදහස් තත්වයෙන් බැහැරවූ යේසුස්වහන්සේ එය වැළඳගත් සේක. අප දුක්විඳින විට අප ගැන හරවත්ව සැලකිලිමත් වනු පිණිස උන්වහන්සේ වේදනාව තුළින් ගමන්කළ සේක. එදා පුරාණ උයනේදී කළ තෝරා ගැනීමෙන් ගලා ආ සියලුම ප්‍රතිවිපාකයන්ගේ බර එනම් අප අත්දකින්නාවූ දුක්විඳීම් හා අප වරදකරුවන් වීම නිසා

> ආදම් සහ ඒව විසින් කරනු ලැබූ තෝරාගැනීම් ප්‍රතිවිපාකයක් ලෙස පැමිණි මරණයේ කොටසක් වන්නේ අකීකරුකම සඳහා දඬුවම වන දෙවියන්වහන්සේ වෙතින් අවසාන සදාකාලික වෙන්වීමය. එම දඬුවම ඉවත් කිරීම සඳහාවූ අවශ්‍යතාවන් කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණය මගින් සම්පූර්ණ විය.

ලබන්නාවූ දඬුවම් යන දෙකම යේසුස්වහන්සේ ඉසුලූ සේක.

යේසුස්වහන්සේ පැමිණියේ අපගේ අසරණ බව හැදෑරීමට හෝ විශ්ලේෂණය කිරීමට නොවේ. උන්වහන්සේ පැමිණියේ ඒ සියල්ල උන්වහන්සේ වෙතට පවරා ගැනීමටය. උන්වහන්සේ පැමිණියේ අප සමඟ සිටිමින් අප වෙනුවෙන් දුක් විඳීමටය. උන්වහන්සේගේ දුක්විඳීම මගින් එම අවස්ථාවේ ඇතිවන වේදනාව හා මතු සදාකාලයට පැමිණෙන අපගේ දුක්විඳීම යන දෙකෙන්ම අප නිදහස් කරනු ලැබ ඇත.

කුරුසියේ දැක්වූ සැලකිල්ල. පුත්‍රවූ දෙවියන්වහන්සේ පැමිණියේ මේ ලෝකයේ කුණු දුවිලි මත ඇවිදිමින් දුක්විඳීම පිණිසය. එසේම උන්වහන්සේගේ බලය හා ආශ්වර්යවත් ක්‍රියා මගින් ඒවාට අභියෝග කිරීමටත් ඉන්පසු අපගේ පාප සහ ඒවායේ ප්‍රතිවිපාක උදෙසා කුරුසිය මත මිය යමින් ඒවා උන්වහන්සේ මතට ගැනීමටත්ය. උන්වහන්සේගේ දුක්විඳීම් තුළින් යේසුස්වහන්සේ උන්වහන්සේගේම සෙනඟ දුක්විඳින විට ඔවුන් ගැන සැලකිලිමත් වීමට තමන්වහන්සේට ඇති හැකියාව සහ කැමැත්ත නිදර්ශනය කළසේක.

පුරාණ ඉශ්‍රායෙලයේ පූජකවරයාගේ භූමිකාව වූයේ දෙවියන්වහන්සේ ඉදිරියේ මිනිසුන් නියෝජනය කිරීමය. යේසුස්වහන්සේ “එම්මානුවෙල්” “(දෙවියන්වහන්සේ අප සමඟය” මතෙව් 1:23) බවට පත්වෙමින් දුකට පත්වන සෙනඟ අතර ජීවත්වූ සේක. වේදනා හා දුක්විඳීම් මධ්‍යයේ ජීවත්වන අය සමඟ වැඩකළ සේක. අප වෙනුවෙන් දුක්විඳීම පවා අත්දුටු සේක. හෙබ්‍රෙව් රචකයා

යේසුස්වහන්සේගේ දුක්විඳීම් වලින් අගනා සහනයක් ඉස්මතු කොට දක්වන්නේය. "මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය" (හෙබ්‍රෙව් 4:15).

අප වේදනා විඳින කල, උන්වහන්සේ අප වේදනා විඳින බව හා අප වේදනාවට පත්වූයේ කෙසේදැයි යන්න තේරුම් ගන්නා බව සහතිකය. ඊට හේතුව උන්වහන්සේට අපට මෙන් වේදනා තිබූ බැවින්ය. උන්වහන්සේ සෝදිසි හා පරීක්ෂා සේම කුරුසිය මත කෙනෙකු සිතාගත නොහැකි තරම් දුක්විඳීමක් අත්දුටු සේක. අපගේ උත්තම පූජකයාණන් ලෙස, අපගේ බිය හා වේදනා පිළිබඳව පූර්ණ වටහා ගැනීමක් ඇතිව යේසුස්වහන්සේ පියවූ දෙවියන්වහන්සේ

යේසුස්වහන්සේ අත්දුටු කායික හා මානසික වේදනාව වූ දෙවියන්වහන්සේ ගෙන් වෙන්වීම අප අත්දකින වේදනාවට සමානය. කෙසේ වෙතත් යේසුස්වහන්සේගේ දුක්විඳීම අපගේ දුක්විඳීමට වඩා බොහෝ ගැඹුරු විය. යේසුස්වහන්සේ අපගේ පාප උන්වහන්සේ මතට ගත් අවස්ථාවේ පියවූ දෙවියන්වහන්සේට උන්වහන්සේ දෙස තවදුරටත් බලා සිටීම ඉවසාගත නොහැකි විය. යේසුස්වහන්සේ සහ උන්වහන්සේ අතර වූ පරිපූර්ණ එක්සත්කම කැඩී ගියේය. ඒ සියල්ල දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වන ප්‍රේමය සහ අප නැවත උන්වහන්සේ වෙතට ගෙන ඒමට තිබූ ආශාව කරණකොටගෙනය.

ඉදිරියේ අප නියෝජනය කරන සේක. යේසුස්වහන්සේ අප නියෝජනය කරන්නාවූ පියාණන්වහන්සේ අපගේ සැනසුම අපගේ සැනසිල්ල පිළිබඳව දැඩි ප්‍රේමයක් හා සැලකිල්ලක් දක්වන සේක: "දයාබර කරුණාවල පියවූද සෑම සැනසිල්ලේ

දෙවිවූද අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.” (2 කොරින්ති 1:3-4).

අපගේ වේදනාව හා අහිමිවීම තුළ අප මොරගසන්නේ යේසුස්වහන්සේ තුළින් අපගේ දුක්විඳීම්වලට ඇතුළුවූ දෙවියන්වහන්සේටය. අප කරුණාව අයැද සිටින්නේ උදයෙන් උදය අප කෙරෙහි ඇති කරුණාව අලුත් කරන්නාවූ දෙවියන්වහන්සේගෙන්ය (විලාප ගී 3:22-23). අප ගැන උන්වහන්සේ සලකන බව දැනසිටිමින් අප රැකබලා ගැනීම උන්වහන්සේ මත තැබීමට අපට පුළුවන්කම ලැබී ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය හා උන්වහන්සේගේ නැවත නැගිටීම නිසාය.

කරුණාවේ යාච්ඤාව (The Mercy Prayer) යන අදහස දෙන ඉංග්‍රිසි කෘතියෙහි සභාපාලක රොබට් ගෙලිනස් දක්වා ඇති පරිදි:

පව් කරන්නාවූ අයට හා දුක් විඳින අයට
පාපය නිසා දුක්විඳින අයට
පව්කරන්නාවූ අයට ඔවුන්ගේ දුක් විඳීමෙන්
සහනය දෙන පිණිස
ස්වාමිනි අපට කරුණා කළ මැනව.

යයි අප ඉල්ලා සිටින්නේ මේ දෙවියන්වහන්සේගෙන්ය.



පහ

# දුක්විඳීමේ අවසානය

**වේදනාව ඒ සඳහා ක්‍රියාත්මක වීමට බලකරන්නේය "අපගේ සතුටේදී අපගේ හෘදය සාක්ෂියේදී දෙවියන්වහන්සේ අපට රහසින් කථා කරනසේක නුමුත් අපගේ වේදනාවේදී කෑගසන සේක" බිහිරිව ඇති ලෝකයක් අවදි කරවන්නට උන්වහන්සේගේ ශබ්ද වාහිනිය එය වේ.**

(සී. එස්. ලූවිස්, වේලාව නම් ගැටලුව The Problem of Pain)

අභාග්‍යයකට ජීවිතයේ පොදු ලක්ෂණයක් බවට නූතන ලෝකයේ දුක්විඳීම පත්වී තිබුණද පැමිණීමට නියමිත ලෝකයේ වේදනාවට සහ දුක් විඳීමට තැනක් නොලැබෙනු ඇත. මෙය, කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණය සිදුවීම සමඟ අඩක් සම්පූර්ණ කරනු ලැබීය.

දුක්විඳීමේ දිගු සෙවණැලි අප පසුකර ඉහළින් යනවිට අනුග්‍රහය කරණකොටගෙන ඒවා දරා සිටීම අපට උපකාර පිණිස බලාපොරොත්තුවක් කුරුසිය ලබා දෙන්නේය. වැරදි දේ නිවැරදි

කරන්නාවූ හා දුක්විඳීම අවසන් කරන්නාවූ කාලයක් පිළිබඳව පොරොන්දුව අපට දෙන්නේ කුරුසිය.

ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගැනීම නිසා පිටුවහල් කරනු ලැබ තමන්ගේ ජීවිතයේ අවසාන කාලයට ළඟාවී සිටි ප්‍රේරිත යොහන් මෙම පොරොන්දුව ඉෂ්ඩවීම කෙබඳු දැයි දැකීම් මාත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ මෙසේය.

"දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමඟය. උන්වහන්සේ ඔවුන් අතර වාසය කරන සේක. ඔව්හු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය. දෙවියන්වහන්සේම ඔවුන් සමඟ සිටිමින් ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිසදමනසේක. මරණය තවත් නොවන්නේය. වැලපීමද හැඬීමද වේදනාවද තවත් නැත. මක්නිසාද පරණ දේවල් පහව ගියේය"යි සිංහාසනයෙන් කියන මහත් හඬක් මට ඇසුණේය.

සිංහාසනය පිට වැඩහුන් තැනන්වහන්සේ කථා කොට: "බලව සියල්ල අලුත් කරමි"යි කීසේක. තවද උන්වහන්සේ කතාකොට: "ලියන්න, මක්නිසාද මේ වචන විශ්වාසය. සැබෑය"යි කියන සේක. උන්වහන්සේ මට කථාකොට: "ඒවා ඉෂ්ටවුණේය. මම අල්ෆා සහ ඔමේගාය. පටන්ගැන්ම හා අන්තිමය. පිපාසය ඇත්තාට මම ජීවන - වතුර - උල්පතෙන් නොමිලයේ බොන්ට දෙන්නෙමි. ජයගන්නා මේ දේවල් උරුමකර ගන්නේය. මම ඔහුගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔහු මගේ පුත්‍රයා වන්නේය" (එළිදරව් 21:3-7).

අපි දුක්විඳින විට දෙවියන්වහන්සේ කොතැනකද? අප සමීපයේය. අපි අත්දකින දේවල් අත් දකින්නට උන්වහන්සේ ස්වකීය පුත්‍රයාණන් හට ඉඩහැරිය සේක.



අප දුක්විඳින විට දෙවියන්වහන්සේ කොහිද? අප අසළය.

අපගේ දුක්විඳීම් වලට මිල ගෙවන්නා වූ හා උන්වහන්සේ සමඟ සම්බන්ධතාව යළි ඇතිකර ගැනීමට අවස්ථාව උදා කරන්නාවූ කුරුසිය උන්වහන්සේ සැපයූ සේක. මතු පැමිණෙන්නාවූ ජීවිතයේදී මේ සියල්ල නොතිබෙන බවට පොරොන්දු වන දෙවියන්වහන්සේ උන්වහන්සේය.

එළිදරව් 21 වචන තුළින් බයිබලයේ කතන්දරය වටයක් ගොස් ආපසු මුලට එන්නේය. පාරාදීසයේ සිට අහිමි වූ පාරාදීස තුළින් පාරාදීසය යළි ලබා ගැනීම ඒ වටයයි. පළමු පුරුෂයා සහ ස්ත්‍රිය අතර සීමා මායිම් නොතිබූ පරිපූර්ණ සම්බන්ධතාවකින් ආරම්භ වී, සෑම ආකාරයකින්ම පරිපූර්ණ වන සදාකාල සම්බන්ධතාවකින් අප අවසාන කරන බව අපි දකින්නෙමු.

ලෝකයේ වේදනාව නමැති ගැටලුවේ අවසානය මෙයය. දෙවියන්වහන්සේ අපගේ වේදනාවන්, අරගල හෝ සිත් රිදීම් පිළිබඳව උනන්දුවක් නොදක්වන්නේ යැයි අප බියවිය යුතු නොවේ. අපගේ දුක් වේදනා වලදී උන්වහන්සේ අප සමඟ සිටින සේක.

ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනව වත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන් කරන්නේද? ඒ හැටියට දවස මුළුල්ලේ ඔබ නිසා අපි මරණු ලබමුව“ මරණයට නියම කළ බැටළුවන් මෙන් ගණන්ගනු ලැබුවෙමු යයි ලියා තිබේ. නුමුත් අපට ප්‍රේමකළා වූ තැනන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේ දී අතිශයින්ම ජයගන්නෝ වමුව” මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්, ගැඹුරටවත්, අන්කිසි මැවිල්ලකටවත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකි වන්නේයයි ඒකාන්තයෙන්ම දනිමි” (රෝම 8:35-39).

දෙවියන්වහන්සේ තුළ අප කෙරෙහි ඇති ප්‍රේමය ඉතාම හොඳින් දැකගත හැකි වන්නේ දුක්විඳීම් නොමැති අවස්ථාවක නොව අප දුක්විඳින විට උන්වහන්සේ අප සමඟ සිටීම මගින්ය. උන්වහන්සේගේ අභිමුඛය තුළ අපට සමාදානය ඇත.

Discovery Series®

## *බයිබලයේ ජීවිත වෙනස් කරන්නාවූ ප්‍රඥාව සියලු දෙනා හට තේරුම් ගැන්වීම හා ඊට සමීපවීමට සැලැස්වීම අපගේ මෙහෙවරයි.*

ඩිස්කවරි දැනුම පොත් පෙල, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව සත්‍යයන් සමබරවත්, සිත් ගන්නා සුළු අකාරයටත් සහ සැමට ලබා ගත හැකි ආකාරයටත් ජීවිතයේ සෑම පැතිකඩකටම දේව වචනය අදාලවන ආකාරය ඉදිරිපත් කරයි.


දේව වචනය බෙදාහැරීම තුළ අප සමඟ හවුල් වීමට, පරිත්‍යාග සඳහා පහත ලින්ක් එක ඔබන්න. අපගේ දිනපතා හෝජනය සේවයට සහ ඩිස්කවරි දැනුම පොත් පෙල වෙත ඔබ දක්වන්නාවූ සහයෝගයට ස්තූති.


කිසිදු කණ්ඩායමකින් හෝ නිකායකින් අරමුදල් සැපයෙන්නේ නැති නමුත් ඉතා කුඩා ප්‍රමාණයකින් හෝ උපකාර කරන බොහෝ පරිත්‍යාගශීලීන් නිසා බයිබලයේ ජීවිත වෙනස් කරවන ප්‍රඥාව තවත් අය වෙත රැගෙන යාමට අපගේ දිනපතා හෝජනය සේවයට හැකිවී තිබේ.


පරිත්‍යාග


# වත්මන් ගැටලු සඳහා බයිබලයෙන් ප්‍රඥාව





**ඩිස්කවරි දැනුම පොත් මාලාවේ සියලු පොත් නිර්මාණය වී ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ඔබගේ අවබෝධය සහ අගය කිරීම වර්ධනය කිරීම සඳහාය. මේ සියලු සම්පත් පුද්ගලික අධ්‍යයනයන්, කුඩා කණ්ඩායම් සහ ශුභාරංචි සේවය සඳහා භාවිතා කළ හැක.**

වැඩිදුර විස්තර සඳහා කරුණා කර අප අමතන්න:
දුරකථන අංකය: 011 272 1252
ජංගම දුරකථන අංකය: 0778 488 288
ඊ-මේල්: srilanka@odb.org